# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරණලදී.

නො. 7,987 — 1933ක්වූ ජූනි මස 16 වෙනි දිනවූ සිකුරාදා.


## Part IV. — හතරවෙනි කාණ්ඩය.

M.L.A.—I/374

### ලංකාණ්ඩුකාර උතුමාණන්වහන්සේ විසින් නිකුත්කරනු ලබන ප්‍රකාශයයි.

ශ්‍රීම් නොම්සන්,

වර්ෂ 1911යේ මුහුදු වෙරළ ආරක්ෂාකිරීමේ ආඥාපණතේ 3වෙනි වගන්තියෙන් හා වර්ෂ 1931කේ ලංකා (රාජ්‍ය සභාවේ) රාජසභාවේ නියෝගයේ 93වෙනි වගන්තියෙන් ලංකාණ්ඩුකාර පදවිය ලැබ් කරවන අපවෙත පැවරී තිබෙන බලයේ ප්‍රකාර මේ දිවසිනේ මුදු වෙරළේ මෙහි පහත පෙනෙන උපලේඛනයේ දක්වා නියමකොට තිබෙන කොටසය වැලි, ගල්, හිරිගල් හෝ වෙනත් ද්‍රව්‍ය මෙහි පෙනෙන දින සිට නොනයානොහැකි ප්‍රදේශයක් හැටියට අප විසින් මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

උතුමාණන්වහන්සේගේ අණපරිදි,

සී. සී. වූලි,

1933ක්වූ ජූනි මස 13වෙනි දින කොළඹදීය. ආණ්ඩුකාරයාණන්වහන්සේගේ ලේකම් වර්‍යා.

දෙවියන්වහන්සේ මහරජතුමා රක්ෂාකෙරෙත්වා

උප ලේඛනය.

මාතර–හම්බන්තොට මහ පාරේ නොම්මර 120 දරන හැතැප්ම කණුවත් කිරම ඔයේ මෝයත් අතර පිහිටි හම්බන් තොට දිස්ත්‍රික්කයේ බස්නාහිර ගිරුවාපත්තුවේ ගොයම්බොක්කේ සිට මැඹිල්ල දක්වාවූ මුහුදු වෙරළයි.

---

### ආණ්ඩුවට ඉඩම් ලබාගැනීම සම්බන්ධ දැන්වීම.

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3කේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම්:—මීගමුවේ සිං ජෝර්ජ් බුයිව්, ප්‍රසිඛ පාර විසාලකිරීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියා කරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් නියිආකාරව මට අණ ලැබීතිබේ, ඒ ඉඩම්නම්:—

සිතියමේ නො. A. 46. ගම—කාමච්චෝඩෙ.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහන, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | මාදන්ගහවත්ත, වරිපනම් නො. 38වේ කොටසක් | පොල්ගස් 2ක්ද, අතුසෙවිලිකළ මැටියෙන් සාදනලද ගෙවල් 3කින් යුත් ගෙවල් පේලියක්ද, අතුසෙවිලිකළ හුණෙන් බදිනලද කුස්සියක් සහ අතුසෙවිලිකළ මඩුවකින්ද යුත් පොල්ඉඩම | ඒ. මොහමද් අබුසාලි සහ ඒ. සේනලා අබ්දීන්, කාමච්චෝඩෙ, ඒ. පාතුම්මා සහ ඒ. හසීම්, හුනුපිටිය, මීගමුව | 0 0 6·47 |
| 2 | එම .. | වත්ත (හිස්ඉඩම) .. .. | එම, දුරෙරසි කානිටුම්මා විසින් ආරවුල් | 0 0 0·28 |
| 3 | මාදන්ගහවත්ත, වරිපනම් නො. 36යේ කොටසක් | පොල්ගස් 4ක් සහ අතු සෙවිලිකළ මැටියෙන් සාදනලද ගෙවල් 3කින් යුත් ගෙවල් පේලියක් ඇති පොල්ඉඩම | දුරෙරසි කානිටුම්මා .. | 0 0 7·48 |

එබැවින් ඉඩම් අයිතිකර ගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්‍ෂ 1933ක්වූ අගෝස්තු මස 25වෙනි දින පස්වරු 2ගේ කනිසමට මීගමුවේ යූ. ඩී. සී. කන්තෝරුවේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒවා ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්‍ෂ 1933ක්වූ ජූනි මස 13වෙනි දින
කොළඹ කච්චේරියේදීය.

ආර්. ඇස්. වී. පෝලියර්,
ආණ්ඩුවේ උප ඒජන්ත වම්හ.

———

වර්‍ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3ගේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—දකුණු දිසාවේ මාතර දිස්ත්‍රික්කයේ වැල්ලබඩපත්තුවේ උඩ අපරැක්ක ගමේ පිහිටි බටදෙල නමැති ඉඩමට පල්ලේ අපරැක්ක උඩ අපරැක්ක ගම්සභා පාරේ සිට අඩිපාරක් කැපීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්‍ෂ 1876යේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" හයවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් නියිඅකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩමනම්:—

මුල් සිතියමේ නො. A 74. ගම—උඩ,අපරැක්ක.

| නො. | ඉඩමේ නම. | විස්තර. | අයිතිකාමකියන්නා. | මහත, අ.රූ.ප. |
|---|---|---|---|---|
| 4 | බටදලවත්ත | අවුරුදු 3ක් වන පොල් ගස් 3ක් තිබෙන වත්ත | උඩ අපරැක්කේ පදිංචි ඉදන් දිනෙහේ සෙනෙවිරත්න | 0 0 4·8 |

එබැවින් ඉඩම් අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්‍ෂ 1933ක්වූ ජූලි මස 17වෙනි දින උදේ 11ගේ කනිසමට මාතර කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒවා ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්‍ෂ 1933ක්වූ ජූනි මස 2වෙනි දින
මාතර කච්චේරියේදීය.

ඇස්. එච්. වාඩියා,
ආණ්ඩුවේ උප ඒජන්ත වම්හ.

———

වර්‍ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3ගේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම්:—පිදුරුවැල්ල රත්මලේ ගම්සභාපාර සස්ශ්‍රීක කිරීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්‍ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හයවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් නියිඅකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

සිතියමේ නො. 7,758. ගම—වයඹ පලාතේ කුරුණෑගල දිස්ත්‍රික්කුවේ දඹදෙනිහත්පත්තුවේ රංකෝපත්තුකෝරලේ රත්මලේ සහ පිදුරුවැල්ල.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාමකියන්නා. | මහත, අ.රූ.ප. |
|---|---|---|---|---|
| 1 | පොතුපුරන්පිටියේවත්ත | පොල්ඉඩම | (1) මාපාමුදියන්සෙලාගේ කිරිබන්ඩා, (2) එම අප්පුහාමි, (3) එම කිරිමුදියන්සේ | 0 0 23·8 |
| 2 | පිදුරුවැල්ලේවත්ත | මුඩුබිම | කොස්තෝනා මහත්මයා | 0 0 1 |
| 3 | එම | එම | එම | 0 0 0·4 |

එබැවින් ඉඩම් අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදු ජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්‍ෂ 1933ක්වූ ජූලි මස 10වෙනි දින 10.30ගේ කනිසමට කුරුණෑගල කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒවා ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්‍ෂ 1933ක්වූ ජූනි මස 9වෙනි දින
කුරුණෑගල කච්චේරියේදීය.

සී. හැරිසන් ජෝන්ස්,
වයඹ පලාතේ ආණ්ඩුවේ ඒජන්ත වම්හ.

---

## රා සහ අරක්කු තැබෑරුම් සම්බන්ධව වර්‍ෂ 1912යේ අංක 8 දරන ව්‍යවස්ථාව යටතේ දැන්වීම.

### කළුතර දිස්ත්‍රික්කයේ රා රේන්ද, 1933–34.

වර්‍ෂ 1933ක්වූ මැයි මස 12වෙනි දින සහ නො. 7,981 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවූ රා රේන්ද විකිණීමේ කොන්දේසිවලට සහ සියලුම් ඇක්සයිස් ලයිසන්වලට වැටහෙන සාමාන්‍ය කොන්දේසිවලට යටත්ව, පහත දක්වන ෂැඩියුල් පත්‍රයෙහි සඳහන්වූ මන්ඩියේ, වර්‍ෂ 1933ක්වූ ඔක්තෝබර් මස 1වෙනි දින පටන් වර්‍ෂ 1934ක්වූ සැප්තැම්බර් මස 30වෙනි දින දක්වා ඇති දොළොස් මාසය තුළ රා බෙදා විකිණීමේ තනි බලය (නොහොත් රේන්දය) මිලට ගැණීම සඳහා ටැන්ඩර් භාරගනු ලැබේ.

2. එක් අයෙකුගෙන් එක ටැන්ඩරයකට වඩා භාරගනු නොලැබේ. සියලුම ටැන්ඩර් තමා නමින්ම දමන්ට ඕනෑය. ඒජන්ත කෙනෙකුගේ නමින් දමනලද ටැන්ඩර් භාරගනු නොලැබේ.

3. කච්චේරියක හෝ මුදල් භාණ්ඩාගාරයක රුපියල් 500ක් බැඳ එහි කුවිතාන්සිය සෑම ටැන්ඩරය සමග එවන්ට ඕනෑය. කුවිතාන්සියේ නොම්මරයද, දිනද ටැන්ඩරයේ සඳහන් කරන්ට ඕනෑය.

4. රේන්දය ලැබූ අය නොහොත් සඵලවූ ටැන්ඩර්කාරයා, රේන්දය ලැබූ වහාම, රේන්ද විකිණීමේ කොන්දේසි අත්සන්කොට ඇප බැඳීමක් වශයෙන් රේන්දයේ වටිනාකමෙන් මාස 2ක වටිනාකමට වැටහෙන මුදලක් කච්චේරියේ බඳින්ට ඕනෑය.

5. වර්‍ෂ 1933ක්වූ ජූලි මස 7වෙනි සිකුරාදා පෙරවරු 10ට හෝ ඊට මත්තෙන් කළුතර කච්චේරියට ලැබෙන ප්‍රකාර ටැන්ඩර් එවිය යුතුයි. ටැන්ඩර්කාරයෝ එකී වේලාවට කච්චේරියේ සිටින්ට ඕනෑය.

6. වර්‍ෂ 1933ක්වූ ඔක්තෝබර් මස 1වෙනි දිනට පසු පාන දුර නගර මායිමතුළ ඇක්සයිස් නිලධාරියෙක් විසින් දෙනලද බලපත්‍රයක් පිට මිස රා තබාගැනීම තහනම්ය.

7. වැඩිදුර කරුණු කළුතර කච්චේරියෙන් ලබාගත හැකිවේ.

පී. සරවනමුත්තු,
ආණ්ඩුවේ උප ඒජන්ත වම්හ.

වර්‍ෂ 1933ක්වූ ජූනි මස 6වෙනි දින
කළුතර කච්චේරියේදීය.

ෂැඩියුල් පත්‍රය.

| නො. | කොට්ඨාසය. | පලාත. |
|---|---|---|
| 1 | කළුතර තොටමුනේ | අර්ත්කම නගරය තුළ |

තැබෑරුම් අරින වහන වේලාවල්: උදේ 8ට සවස 6.30ට.

———

### කළුතර දිස්ත්‍රික්කයේ අරක්කු රේන්ද, 1933–34.

වර්‍ෂ 1933ක්වූ ඔක්තෝබර් මස 1වෙනි දින පටන් වර්‍ෂ 1934ක්වූ සැප්තැම්බර් මස 30වෙනි දින දක්වා මාස 12ක, මීට යාකර තිබෙන A අකුරයි දරණ ෂැඩියුල් පත්‍රයෙහි සඳහන්වන තැබෑරුම්වල අරක්කු විකිණීමේ තනි බලය (නොහොත් රේන්දය) සම්බන්ධ ටැන්ඩර් වර්‍ෂ 1933ක්වූ මැයි මස 26වෙනි දින සහ නොම්මර 7,983 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවූ "අරක්කු රේන්ද විකිණීමේ කොන්දේසිවලට" සහ සියලුම ඇක්සයිස් ලයිසන්වලට වැටහෙන සාමාන්‍ය කොන්දේසිවලට යටත්ව භාරගනු ලැබේ.

2. ආණ්ඩුවේ උප ඒජන්තතුමාට සුදුසුයයි වැටහෙන අන්දමට යම්කිසි ටැන්ඩරයක් භාරගැනීමට හෝ නොගැනීමට ඔහුට බලය තිබේ. ඒ බලයට යටත්ව (තීරුව සහ අරක්කුවල වටිනාකම හැර) රේන්දය වශයෙන් ඉතා වැඩි ගණන ටැන්ඩර්කරපු අයට විකිණීමේ බලය දෙනවා ඇත.

3. සෑම ටැන්ඩරයම නියම ෆෝර්මයකින් කළයුතුය. එය කළුතර කච්චේරියෙන් ලබාගත හැක.

4. තැබෑරුම් දෙකම එකට (එකක් වශයෙන් සලකා) විකුණනු ලැබේ. එක් අයෙකුගෙන් එක ටැන්ඩරයකට වඩා භාරගනු නොලැබේ. සියලුම ටැන්ඩර් තමා නමින්ම දමන්ට ඕනෑය. ඒජන්ත කෙනෙකුගේ නමින් දමනලද ටැන්ඩර් භාරගනු නොලැබේ.

5. කච්චේරියක හෝ මුදල් භාණ්ඩාගාරයක රුපියල් 500ක් බැඳ එහි කුවිතන්සිය සෑම ටැන්ඩරය සමග එවන්ට ඕනෑය. කුවිතන්සියේ නොම්මරයද දිනද ටැන්ඩරයේ සඳහන්කරන්ට ඕනෑය.

6. රේන්දය ලැබූ අය නොහොත් සඵලවූ ටැන්ඩර්කාරයා රේන්දය ලැබූ වහාම, රේන්ද විකිණීමේ කොන්දේසි අත්සන්කොට ඇප බැඳීමක් වශයෙන් රේන්දයේ වටිනාකමෙන් මාස 2ක වටිනාකමට වැටෙන මුදලක් කච්චේරියේ බඳින්ට ඕනෑය.

7. වර්ෂ 1933ක්වූ ජූලි මස 10වෙනි සඳුදා පෙරවරු 10ට හෝ ඊට මත්තෙන් කළුතර කච්චේරියට ලැබෙන ප්‍රකාර ටැන්ඩර් එවිය යුතුයි. ටැන්ඩර්කාරයෝ එකී වේලාවට කච්චේරියේ සිටින්ට ඕනෑය.

8. ටැන්ඩර් භාරගත්තායින් පසු, ටැන්ඩර් සතුටුදායක නැත්නම්, ආණ්ඩුවේ උප ඒජන්තතුමා ටැන්ඩර්කාරයෝ අතරේ රේන්දය එවලේම වෙන්දේසියේ දමනවා ඇත.

9. වර්ෂ 1932ක්වූ ජූනි මස 16වෙනි දින සහ නො. 7,931 දරණ ආණ්ඩුවේ ගැසැට් පත්‍රයේ පළවූ නො. 234 දරණ ඇක්සයිස් දැන්වීමෙන් නියමකරණලද අරක්කු විකිණීමේ මිල මෙසේ අමුතුකර තිබේ.

රේන්දකාරයා නොහොත් ලයිසන්කාරයා විසින් මෙහි පහත දක්වන මිලය හැර වෙන කිසි මිලයට සිල් බෝතල විකිණීම තහනම්ය:—

| | | |
|---|---|---|
| (i.) | ඩ්‍රෑම් 8වේ සුදු සිල් බෝතලයක් .. | රු. 2·50යි. |
| | ඩ්‍රෑම් 8වේ විශේෂ හැලි අරක්කු බෝතලයක් .. .. | රු. 2·75යි. |
| | ඩ්‍රෑම් 6යේ කළු සිල් බෝතලයක් .. | රු. 1·95යි. |
| | පයින්ට් 1යේ බෝතලයක් .. | රු. 1·30යි. |
| | පයින්ට් 1යේ විශේෂ හැලි අරක්කු බෝතලයක් .. .. | රු. 1·45යි. |

(ii.) අරක්කු සිල්ලර විකිණීමේදී ගැලුමක් රු. 15·12ට හෝ ඩ්‍රෑම් 1ක් ශත 32½ට අඩුවන මිලයකට විකිණීම තහනම්.

10. වැඩිදුර කරුණු කළුතර කච්චේරියෙන් ලබාගත හැකිවේ.

ජී. සරවනමුත්තු,
ආණ්ඩුවේ උප ඒජන්ත ව[illegible].

වර්ෂ 1933ක්වූ ජූනි මස 9වෙනි දින
කළුතර කච්චේරියේදීය.

A.—ෂැඩුල් පත්‍රය.

කළුතර දිස්ත්‍රික්කයේ අරක්කු රේන්ද කොටුසය.

| නො. | කොටුසය. | පළාත. | |
|---|---|---|---|
| 1 | කළුතර තොටමුගේ .. | කලමුල්ල | එකට |
| 2 | එම .. | දියලගොඩ | |

තැබෑරුම් අරින වහන වේලාවල්: උදේ 8ට සහ සවස 6.30ට

## ලංකා සේවින්ස් බැන්කුව.

මෙම බැන්කුවේ මුදල් තැන්පත්කර තිබෙන අයවලුන්ගේ සංවත්සරික රැස්වීම 1933නේ ජූනි මස 26වෙනි සඳුදා ප. ව. 4.30ට අභිනව ව්‍යවස්ථාදායක මන්ත්‍රණ සභා ශාලාවේදී පවත්වනු ලැබේ.

හැන්රි ඒ. ලෝමර්,
සෙක්‍රතාරිස් තැන.

වර්ෂ 1933ක්වූ ජූනි මස 10වෙනි දින කොළඹ
ලංකා සේවින්ස් බැන්කුවේදීය.

## දැන්වීම.

මුහුදුවැලි ආදිය ගෙනයාම තහනම්කිරීමය.

තංගල්ලේ නාගරිකය තුළ පිහිටි සර්කියුලර් පාරට සහ කඩවීදියේ පාරටද, ඒවාට ආසන්නව සමහර ස්ථානයන්හි යාව පිහිටි මුහුදුවෙරළෙන් ගල් හිරිගල් වැලි යනාදිය ගෙනයාමෙන් බොහෝ අන්තරා පැමිණ තිබේ. මෙකී වෙරළෙන් ඉදිරියටත් ගල් හිරිගල් වැලි යනාදිය ගෙනයන්ට ඉඩ හැරීමෙන් යථෝක්ත පාරවල්වලට තවදුරටත් අන්තරා පැමිණෙන්ට හැකි බැවින් දකුණු පළාතේ දිසාපති තැන්පත් ජෝන් ඔන්කන් බ්‍රවුන් වන මම වර්ෂ 1911යේ නොම්මර 12 දරන ආඥාපනතේ පස්වෙනි වගන්තියෙන් මට ලැබීතිබෙන බලයේ ප්‍රකාර මෙහි පහත දක්වන උප ලේඛනයේ සඳහන් මුහුදුවෙරළෙන් ගල් හිරිගල් වැලි යනාදිය ගෙනයෑම මෙයින් තහනම්කරමි.

ජේ. ඕ. බ්‍රවුන්,
දකුණු පළාතේ දිසාපති ව[illegible].

වර්ෂ 1933ක්වූ අප්‍රේල් මස 18වෙනි දින
ගාල්ලේ කච්චේරියේදීය.

උප ලේඛනය.

මාතර හම්බන්තොට මහපාරේ 121¾ සැතැප්ම කනුවද, තංගල්ලේ පිහිටි එංගලන්ත සභාවට අයිති දේවස්ථානභූමියද, කිරමබයේ මෝයද යන මේ ස්ථානයන් අතරෙහි පිහිටි මුහුදුවෙරළයි.

---

තලවිල්ලුවේහි ජූලි මාසේදී පවත්වන ශාන්ත ආන මංගල්‍ය සම්බන්ධවයි.

ඉහත සඳහන් මංගල්‍ය කාලය තුළ ටොන් තුනකට (3) (මගීන් සහ බඩුත් සමග) වැඩි බර ඇති මෝටර් බස් සහ ලොරි පාලාවි–ඒතාල පාරේ ගමනාගමනයකිරීමට තහනම් බවත් ටොන් දෙකකට (2) (මගීන් සහ බඩුත් සමග) වැඩි බර ඇති මෝටර් බස් සහ ලොරි ඒතාල–තල්පිටිය පාරේ ගමනාගමනය කිරීම තහනම් බවත් මෙයින් දන්වමි.

කේ. අල්වාපුල්ලේ,
උප ඒජන්තතුමා වෙනුවට.

වර්ෂ 1933ක්වූ ජූනි මස 9වෙනි දින
පුත්තලමේ කච්චේරියේදීය.

## සුප්‍රීම් උසාවියේ දැන්වීම.

ශ්‍රී ලංකාවිපයේ ගරුකටයුතු උතුම්වූ සුප්‍රීම් උසාවියෙන් මට ලැබීතිබෙන ආඥාවක බලය කරණකොටගෙණ මෙයින් ප්‍රකාශකරන්නේනම් බස්නාහිර දිසාවේ ක්‍රිමිනෙල් නඩු විභාගය වර්ෂ 1933ක්වූ ජූලි මස 10වෙනි දින පෙරවරු 11 පැය පටන් කොළඹ අළුත්කඩේ තිබෙන නඩුසාලාවේ පවත්වන්ට යෙදෙනවා ඇත. එහි යම් කාරණ ඇතුව සිටින සෑමදෙනාම යටකී ස්ථානයට යටකී වේලාවට ඇවිත් පෙණීසිටින්ට ඕනෑවත් ඇර අවසර ඉල්ලා ලබාගෙණ මිස එයින් පිටතට යන්ට නුපුළුවන් බවත් මෙයින් සෑමදෙනාටම දන්වන්නෙමි.

කාල් ඒ. ආන්ට්,
බ. දි. දෙ. පිස්කල් ව[illegible].

වර්ෂ 1933ක්වූ ජූනි මස 9වෙනි දින
කොළඹ පිස්කල් කන්තෝරුවේදීය.

---

ශ්‍රී ලංකාවිපයේ ගරුකටයුතු උතුම්වූ සුප්‍රීම් උසාවියෙන් මට ලැබී තිබෙන ආඥාවක බලය කරණකොටගෙණ මෙයින් ප්‍රකාශකරන්නේනම් රත්නපුර දිසාවේ ක්‍රිමිනෙල් නඩු විභාගය වර්ෂ 1933ක්වූ ජූලි මස 10වෙනි දින පෙරවරු 11 පැය පටන් කොළඹ අළුත්කඩේ තිබෙන නඩුසාලාවේ පවත්වන්ට යෙදෙනවා ඇත. එහි යම් කාරණ ඇතුව සිටින සෑමදෙනාම යටකී ස්ථානයට යටකී වේලාවට ඇවිත් පෙණීසිටින්ට ඕනෑවත් ඇර අවසර ඉල්ලා ලබාගෙන මිස එයින් පිටතට යන්ට නුපුළුවන් බවත් මෙයින් සෑම දෙනාටම දන්වන්නෙමි.

සී. ඒ. වීල්කි,
සබරගමු පළාතේ පිස්කල් උන්නාන්සේ වෙනුවට.

වර්ෂ 1933ක්වූ ජූනි මස 12වෙනි දින
රත්නපුරේ පිස්කල් කන්තෝරුවේදීය.

PRINTED AT THE CEYLON GOVERNMENT PRESS, COLOMBO.